Article 12
Article 13

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2019-12-04

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | සී.එම්.බී. රම්බණ්ඩා මයා,<br>අංක 266, සේරුපිටිය,<br>දමනේවෙල, දෙහිඅත්තකණ්ඩිය. |
| අගතියට පත් අය | : | සී.එම්.බී මංජුල කුමාර මයා, |
| වගඋත්තරකරුවන් | : | 01. ස්ථානාධිපති,<br>පොලිස් ස්ථානය,<br>දෙහිඅත්තකණ්ඩිය. |
| | | 02. උ.පො.ප උක්කුබණ්ඩා මයා,<br>ස්ථානාධිපති (අපරාධ අංශය)<br>පොලිස් ස්ථානය,<br>දෙහිඅත්තකණ්ඩිය. |
| | | 03. පො.කො 43822 ඩී.ඩබ්.එම් කුමාරසිංහ මයා,<br>පොලිස් ස්ථානය,<br>දෙහිඅත්තකණ්ඩිය. |
| | | 04. පො.කො 33965 ටී.එම්. උපසේන මයා,<br>පොලිස් ස්ථානය,<br>දෙහිඅත්තකණ්ඩිය. |
| | | 05. පො.කො 19370 ස්වර්ණ බණ්ඩාර මයා,<br>පොලිස් ස්ථානය,<br>දෙහිඅත්තකණ්ඩිය. |

<u>පැමිණිලි අංකය : **HRC/AM/25/13**</u>

පැමිණිල්ල :-

උක්ත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම පුතු වන සී.එම්.බී මංජුල කුමාර (වින්දිත) යන අය සම්පත් යන අයගේ නිවසේ සිදුවූ මුදල් සොරකමක් සම්බන්ධයෙන් සැකකර 2013 පෙබරවාරි 02 වන දින අත්අඩංගුවට ගත් බවත්, අත්අඩංගුවේදී


| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2505541 / 74 |
| විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / e-mail | sechrc@gmail.com | | | | |
| දුරකථන / தொலைபேசி / Telephone | 94 -11- 2505580 / 81 / 82 | ලේකම් / செயலாளர் / Secretary | 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 1996 |
| වෙබ් / இணையம் / Web | www.hrcsl.lk | | | | |

පහරදීම් සිදුකර ඇති බවත්, අනතුරුව සම්පත් යන අයගේ නැතිවූවායැයි සඳහන් කළ මුදල වන රු. 21,400/- ක මුදල ලබා දුනහොත් තම පුතා නිදහස් කරන බවට 02 වන වගඋත්තරකාර උ.පො.ප උක්කුබණ්ඩා යන අයගේ දැන්වීම මත පැමිණිලිකරුගේ පුතා රජයේ සේවකයෙකු වශයෙන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ සේවය කරන බැවින් අදාළ මුදල් පොළියට ගෙන 02 වන වගඋත්තරකරුට ලබාදුන් බවත් 02 වන වගඋත්තරකාර උ.පො.ප උක්කුබණ්ඩා මහතා එම මුදල් රැගෙන එය සොරකම් කළ මුදල් ලෙස සඳහන් කර අධිකරණයට ඉදිරිපත් කර ඇති බවත්, 2013.02.02 වන දින අත්අඩංගුවට ගත් තම පුතා 2013.02.04 වන දින දක්වා පොලිස් ස්ථානයේ රඳවාගෙන සිටි බවත්, දන්වා ඇත.

වගඋත්තර පාර්ශවයේ සැළකිරීම් :-

පළමු වගඋත්තරකාර ස්ථානාධිපති, පොලිස් ස්ථානය, දෙහිඅත්තකණ්ඩිය විසින් කොමිෂන් සභාව වෙත වාර්තා කර ඇත්තේ, අංක 249 සේරුපිටිය ලිපිනයෙහි පදිංචි වයි.එම් සම්පත් බණ්ඩාර යන අය විසින් තම නිවසේ තිබූ රු. 21400/- ක මුදලක් නැති වූ බවට 2013.02.03 වන දින කරන ලද පැමිණිල්ලට අනුව වින්දිතයා වන සී.එම්.බී.පී මංජුල කුමාර යන අය 2013.02.04 වන දින පැය 2.40 ට 02 වන වගඋත්තරකාර උ.පො.ප උක්කුබණ්ඩා 03 වන වගඋත්තරකාර පො.කො 13822 කුමාරසිංහ, 04 වන වගඋත්තරකාර පො.කො 33965 ටී.එම් උපසේන, 05 වන වගඋත්තරකාර පො.කො 19370 ස්වර්ණබණ්ඩාර යන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇති බවයි.

02 වන වගඋත්තරකාර උ.පො.ප උක්කුබණ්ඩා යන අය විසින් සඳහන් කර ඇත්තේ, තමා දෙහිඅත්තකණ්ඩිය පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කරමින් සිටියදී 2013.02.03 වන දින පැය 10.30 ට වයි.එම් සම්පත් බණ්ඩාර, අංක 249, සේරුපිටිය යන අය විසින් ඔහුගේ වෙළඳසැලේ තිබී 2013.02.02 දින සවස නිවසට ගෙනවිත් තිබූ රු. 2100/- ක මුදල වින්දිතයා වන සී.එම්.බී.ජී මංජුල කුමාර යන අය විසින් සොරකම් කළ බවට පැමිණිල්ලක් ගොනුකළ බවත්, පැමිණිල්ල අනුව 04 වන වගඋත්තරකාර පො.කො 33965 උපසේන හා 03 වන වගඋත්තරකාර පො.කො 13822 කුමාරසිංහ හා 05 වන වගඋත්තරකාර පො.කො 19370 ස්වර්ණ බණ්ඩාර යන නිලධාරීන් සමඟ ගොස් ප්‍රදේශය මගහැර සිටි වින්දිතයා පුද්ගලික ඔත්තුකරුවෙකුගෙන් ලද තොරතුරක් මත විජයපුරදී අත්ඩංගුවට ගැනීමේදී ප්‍රතිරෝධය පෑ බවත්, අවම බලය පාවිච්චි කර අත්අඩංගුවට ගෙන සැකකරුගේ ප්‍රකාශ මත 2014.02.04 වන දින පැය 4.35 ඔහුගේ දෙවන බිරිඳගේ නිවසේ උළුවස්ස උඩ තබා තිබියදී සොරගත් මුදල සොයාගෙන නඩු භාණ්ඩ කුවිතාන්සි 186/2013 යටතේ ද සැකකරු ගමන් කළ යතුරු පැදිය ද නඩු භාණ්ඩ ලෙස අධිකරණයට ඉදිරිපත් කර බීආර් 71/2013 යටතේ අධිකරණයට කරුණු ඉදිරිපත් කළ බවත්, උසාවියේදී සැකකරු වරද පිළිගත් බවත්, වැඩිදුර විභාගය 2013.07.13 දිනට නියමව ඇති බවත් සඳහන් කර ඇත. සැකකරුට පහරදීමක් හෝ ඔහු දුන් මුදල් නඩු භාණ්ඩ වශයෙන් ඉදිරිපත් නොකරන ලද බවත්, අත්අඩංගුවට ගැනීම පිළිබඳ අමනාපයන් සාමාන්‍යයෙන් මෙවැනි චෝදනා සිදුකරන බවත් කොමිසම වෙත ප්‍රකාශ කර ඇත.

එසේම සිද්ධියට අදාළව සාක්ෂි සටහන් කර ගැනීමක් නොකළ බවත්, ඇසින් දුටු සාක්ෂි නොමැති බවත් පොලිස් ස්ථානයේ පැමිණිලිකරු වන වයි.එම්. සම්පත් බණ්ඩාර විසින් "තම නිවසට පැමිණියේ මංජුල යන අය පමණක් බවත්, මුදල් ලබා ගැනීම පිළිබඳ සැකකළ හැකි වන්නේ එම අය පමණක් බවත්" පැමිණිල්ලේ සඳහන් කර ඇති හෙයින් ඔහු අත්අඩංගුවට ගත් බව තවදුරටත් ප්‍රකාශ කර ඇත.

**පැමිණිල්ලේ සාක්ෂි :-**

මෙම පැමිණිල්ල පිළිබඳව පරික්ෂණය 2013.09.06 දින හා 2013.10.02 වන දින අම්පාර ප්‍රාදේශීය කාර්යාලයේදී පවත්වා ඇත. එහිදී වින්දිතයා වන මංජුල කුමාර විසින් ප්‍රකාශ කර ඇත්තේ, 2013.02.02 වන දින තමා තම පියා වන මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු හට අයත් යතුරුපැදියෙන් තම බිරිඳගේ ගෙදරට ගොස් එන අතරමගදී ප.ව 2.00 ට පමණ කිසිදු කරුණු විමසීමකින් තොරව දෙවන වගඋත්තරකාර උ.පො.ප උක්කුබණ්ඩා මහතා විසින් අත්අඩංගුවට ගත් බවත් එසේම 02 වන 03 වන සහ 04 වන වගඋත්තරකරුවන් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී තමාට පහරදුන් බවත්, අනතුරුව පොලිස් ස්ථානයේ රඳවා සිට 2013.02.04 දින සවස 4.30 ට පමණ උසාවියට ඉදිරිපත් කළ බවත් වේ.

පැමිණිල්ලේ සාක්ෂිකරුවකු සිය කරුණු දැක්වීමේදී සඳහන් කර ඇත්තේ, කොමිසම වෙත ලිපියක් ලබාදෙමින් 2013.02.02 වන දින දහවල් 12.00 ට පමණ ඔවුන් නිවසේ සිටියදී මංජුල කුමාර යන අය සමඟ මෝටර් බයිසිකල් දෙකකින් පැමිණි පොලිස් නිලධාරීන් තිදෙනකු එම සාක්ෂිකරුගේ නිවස අසලට පැමිණි බවත්, අනතුරුව නැවත සී.එම්.බී මංජුල කුමාර (වින්දිතයා) යන අය නැවත බයිසිකලයේ දමාගෙන පොලිසිසිය වෙත රැගෙන යනු දුටු බවත් පවසා ඇත.

පැමිණිලිකාර සී.එම්.බී.පී රම්බණ්ඩා යන අය විසින් කොමිෂන් සභාව වෙත ලිපියක් ඉදිරිපත් කරමින් තම පුතා වන සී.එම්.බී.පී මංජුල කුමාර (වින්දිතයා) 2013.02.02 වන දින අත්අඩංගුවට ගත් බවත් 2013.02.03 පොලීසියට ගොස් විමසා සිටියදී 02 වන වගඋත්තරකාර උ.පො.ප බණ්ඩාර මුදල් ගෙනවිත් භාර දී පැමිණිල්ල අවසන් කරගන්නා ලෙස කරන ලද දැන්වීම අනුව නවරත්න යන අයගෙන් මුදල් පොළියට ගෙන නවරත්න මහතා ද සමඟ පොලීසියට ගොස් පොලීසියේ සිටි ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයතිස්ස මහතාට එම මුදල් දුන් බවත්, ඔහු විසින් මුදල් ගණන් කර දෙවන වගඋත්තරකාර උ.පො.ප උක්කුබණ්ඩාර මහතාට ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත. ඒ අවස්ථාවේදී පොලිස් ස්ථානයේ සිටි අය ලෙස එල්.එල් මයුරි සන්දා (වින්දිතයාගේ බිරිඳ) පී.ජී ජයතිස්ස හා තවත් අය (නම් පැහැදිලි නොමැති අය) අත්සන් කර ඇති ලිපියක් ඉදිරිපත් කර ඇත.

ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු වන එගොඩ ගෙදර ජයතිස්ස යන අය විසින් කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශයක් ලබා දෙමින් 2013.02.02 වන දින සවස 5.30 ට පමණ තම පුතාව අත්අඩංගුවට ගත් බවට පැමිණිලිකරු විසින් කරන ලද දැනුම්දීමට අනුව පසු දින එනම්, 2013.02.03 වන දින පෙ.ව 7.15 ට පමණ පැමිණිලිකාර රම්බණ්ඩා මහතා සමඟ පොලීසියට යමින් සිටියදී 02 වන වගඋත්තරකාර උ.පො.ප

උක්කුබණ්ඩාර හමුවී පැමිණිලිකරුගෙන් "උඹ සල්ලි ගෙනාවද" ඇසූ බවත්, සල්ලි නොගෙනා බව කී විට "කොල්ලා උසාවි නොදා බේරා ගන්න සල්ලි අරන් වරෙන්" කී බවත්, ඒ අනුව පැමිණිලිකරු සල්ලි ගෙන ඒමට ගිය බවත්, තමා පොලීසියට ගිය බවත්, එහිදී පැමිණිලිකරු වන රම්බණ්ඩා මහතාගේ ලේලිය විසින් තම ස්වාමිපුරුෂයා වන වින්දිතයාට පොලිස් නිලධාරීන් පහරදුන් බව පැවසූ බවත්, වින්දිතයා වන මංජුල පොලීසිය පිටුපස සිට රුගෙන එනවා තමා දුටු බවත්, "සල්ලි ගේන්න ගියා සල්ලි දෙනවා නම් ඇයි ගහන්නේ" කියා තමා ඇසූ බවත්, එවිට "මෙයා වෙන් එකක් කඩලා තියනවා" කියා පොලීසිය කී බවත්, තමා එයට විරුද්ධ වූ බවත් දහවල් 2.00 ට පමණ රම්බණ්ඩා මහතා ලබාදුන් රු. 21400/- ක මුදල තමා විසින් 02 වන වගඋත්තරකාර උ.පො.ප උක්කුබණ්ඩාර හට ලබාදුන් බවත් ඉන් පසුව 02 වන වගඋත්තරකරු විසින් "උඹේ පුතා උඹට දෙන්නේ නෑ. සල්ලි දෙන්නෙත් නෑ. උසාවියෙන් බේරගන්න" කියා පැවසූ බවටත් ප්‍රකාශ කර ඇත.

එසේම එම්.එම්.ජී නවරත්න නැමැති අයකුගෙන් 2013.02.03 වන දින රු. 25000/- ක මුදලක් ණයට ලබාගත් බවට වූ මුදල් උකසට ගත් පොරොන්දු පත්‍රය ඉහත කරුණු සනාථ කරමින් පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇත.

**විමර්ශනයේදී අනාවරණය වන කරුණු :-**

වින් ත පාර්ශවය වන සී.එම්.බී.ජී කුමාර (පැමිණිලිකරුගේ පුතා) අත්අඩංගුවට ගැනීම 2013.02.02 වන දින ප.ව 2.00 ට පමණ සිදුව ඇති බව පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන සාක්ෂි අනුව අනාවරණය වේ. 01, 02 වන වගඋත්තරකරුවන් විසින් 2013.02.04 දින රාත්‍රී 2.00 ට පමණ සැකකරු මාර්ගයේ එමින් සිටියදී රැක සිට අත්අඩංගුවට ගත් බවට කරන ප්‍රකාශය ඉදිරිපත් වී ඇති සාක්ෂි මත බැහැර කළයුතු බව පෙනේ. ඒ අනුව වින්දිතයා 2013.02.02ප.ව 2.00 ට පමණ අත්අඩංගුවට ගෙන 2013.02.04 දින අධිකරණයට ඉදිරිපත් කරන තෙක් දින 02 කට ආසන්න කාලයක් නීතිවිරෝධීව රඳවා තබාගෙන ඇති බව නිරීක්ෂණය වේ.
එසේම යාපා මුදියන්සේලාගේ සම්පත් බණ්ඩාර යන අයගේ පැමිණිල්ල සටහන් කිරීම 2013.02.03 වන දින සිදුව ඇති බවද අනාවරණය වේ. ඒ අනව පෙනී යන්නේ වින්දිතයා අත්අඩංගුවට ගෙන තිබෙන්නේ පැමිණිල්ලක් පවා සටහන් කර නොගෙන බවයි.

යාපා මුදියන්සේලාගේ සම්පත් බණ්ඩාර යන අය විසින් පොලිස් ස්ථානය වෙත පැමිණිල්ල ඉදිරිපත් කර ඇත්තේ, 2013.02.03 වන දින වින්දිතයා අත්අඩංගුවට ගැනීමෙන් පසුවය. ඒ අනුව වින්දිතයා අත්අඩංගුවට ගැනීමට පෙර වගඋත්තරකරුවන් විසින් කිසිදු පරීක්ෂණ කටයුත්තක් සිදුකර නොමැති බවත්, මුදල් නැතිවීම පිළිබඳව පැමිණිලි කළ පාර්ශවය විසින් හුදෙක් වින්දිතයා වන මංජුල කුමාර සොරකම කළ තැනැත්තා ලෙස සැක බවට සිදුකළ වාචික ප්‍රකාශය මත පමණක් පදනම්ව අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති බවත් අනාවරණය වේ. ඒ අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි තිබේද යන්න ගැටළු සහගත වේ.

අදාළ පැමිණිල්ල සමථයකට පත්කර ගැනීම සඳහා පැමිණිකාර සී.එම්.බී.ජී රම්බණ්ඩා මහතා විසින් දෙවන වගඋත්තරකාර උ.පො.ප උක්කුබණ්ඩා මහතාට මුදල් ලබා දී ඇති බව සාක්ෂි මගින් තහවුරු වේ.

පළමු වගඋත්තරකාර ස්ථානාධිපති, පොලිස් ස්ථානය, දෙහිඅත්තකණ්ඩිය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමුකළ 3803/2013 හා 2013.07.30 දින දරණ වාර්තාවේ දක්වා ඇත්තේ, 2013.02.04 වන දින ලද තොරතුරක් මත 02 වන 03 වන 04 වන සහ 05 වන වගඋත්තරකරුවන් විසින් සැකකරු (වින්දිතයා) අත්අංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කරන ලද බවයි. ඉන් අනතුරුව පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ පුද්ගලයින්ද පොලිස් ස්ථානයට පැමිණි අතර සැකකරුගේ පියා (පැමිණිලිකරු) විසින් එම පුද්ගලයින් සමඟ සාකච්ඡා කර මුදල් ටික ඔවුන් වෙත ලබා දී පොලිස් ස්ථානයේ වින්දිතයාට විරුද්ධව ගොනු කර තිබූ පැමිණිල්ල සමථයකට පත්කිරීමට ඉල්ලීමක් කරන ලද බවද සඳහන් කර ඇත. ඒ අනුව 02 වන වගඋත්තරකාර උ.පො.ප උක්කුබණ්ඩා මහතා විසින් 2013.02.04 වන දින පැය 4.50 ට සැකකරුගේ බිරිඳගේ නිවසේ උළුවස්ස යට සඟවා තිබියදී රු. 21400/- ක මුදල සොයා ගත්තායැයි යොදා ඇති සටහන් වල සත්‍යභාවය පිළිබඳ සාධාරණ සැකයක් මතු වේ.

මෙම පැමිණිල්ල මගින් වින්දිතයා හට අත්අඩංගුවට ගැනීමේදී 02, 03, 04, 05 යන වගඋත්තරකරුවන් විසින් පහරදුන් බවත්, එසේම 2013.02.02 දින සිට 2013.02.04 වන දින දක්වා පොලිස් ස්ථානයේ රඳවාගෙන පහරදුන් බවත්, පැමිණිලිකරු ප්‍රකාශ කර තිබුනද පහරදීමක් සිදුවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමක් සිදුකර නොමැත.

එසේම උක්ත මුදල් නැතිවීම පිළිඳව පැමිණිල්ලට අදාළ නඩු කටයුත්ත මේ වන විටද දෙහිඅත්තකණ්ඩිය මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පවතින බව අනාවරණය වේ. ඒ අනුව කිසිදු විමර්ශනයකින් තොරව නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගැනීම පිළිබඳව මේ අවස්ථාවේදී කොමිෂන් සභාව විසින් මෙම නිර්දේශයේදී සලකා බැලීම සිදුකර නොමැත.

ඉහත සියළු සාක්ෂි අනුව පෙනී යන්නේ වගඋත්තරකරුවන් විසින් සොරකමක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් සටහන් කරගැනීමට පෙර වින්දිතයා 2013.02.02 වන දින ප.ව 2.00 ට පමණ අත්අඩංගුවට ගෙන නීති විරෝධී ලෙස දින 02 ක් රඳවා තබාගෙන ඇති බවත්, හා ඒ පැමිණිල්ල සමථ කිරීමට බව හඟවා ලබාගත් මුදල් සොරකම් කළ මුදල් ලෙස අධිකරණයට ඉදිරිපත් කිරීම සිදුකර ඇති බවත් වේ.

ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 13 වන ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති නීතිය නියම කළ ආකාරයට මිස කිසිවෙකු අත්අඩංගුවෙහි රඳවා තබානොගතයුතුය යන මූලික අයිතිවාසිකම ද 12 වන ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති නීතිය ක්‍රියාත්මක කිරීම සර්ව සාධාරණ විය යුතුය යන මූලික අයිතිවාසිකමද පළවන හා දෙවන වගඋත්තරකරුවන් විසින් කඩකර ඇති බව අනාවරණය වේ.

නිර්දේශය :-

01. 01 වන වගඋත්තරකරු හා 02 වන වගඋත්තරකරු විසින් වින්දිතයා වන සී.එම්.බී.ජී මංජුල කුමාර යන අයට රු. 10,000/- ක වන්දි මුදලක් ගෙවිය යුතුය.

02. අදාළ පොලිස් නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගෙන කොමිෂන් සභාවට වාර්තා කළ යුතු බවට පොලිස්පති වෙතද නිර්දේශ කරනු ලැබේ. (නිර්දේශයේ පිටපතක් යොමු කරනු ලැබේ)

2019.12.27 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රමණී මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
BMICH කොළඹ 07.

සැ.යු :- අදාළ මුදල "මුදල් ඇණවුමක් " මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන්න.

B/